ද මැසිනොද් විදුහල, කඳාන
De Mazenod College, Kandana

# පුරවැසි අධ්‍යාපනය

පළමු වාර පරීක්ෂණය - 2024 | 9 ශ්‍රේණිය | කාලය පැය 02

2024-06.

➢ ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

1) සමාජයක මූලික තැනුම් ඒකකය වන්නේ
   1. පාසල
   2. ආගමික ආයතන
   3. පවුල
   4. සමාජ ආයතන

2) සමාජය සම්බන්ධයෙන් දැක්වෙන අසත්‍ය ප්‍රකාශයකි
   1. පුද්ගලයාට සමාජ කීපයකම සාමාජිකත්වය ගත නොහැකියි
   2. පුද්ගල හා සංවිධාන සමූහයක එකතුවකි
   3. සෑම සමාජයකටම ආවේණික සිරිත් විරිත් නීති රීති පිළිගැනීම් ඇත
   4. පුද්ගලයා හා සමාජය අතර සබඳතා ශක්තිමත් වූ තරමට සමාජ යහ පැවැත්ම ඇති වේ

3) මධ්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීමට ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයක් වන්නේ
   1. හෙල්දි ලංකා ආයතනය
   2. සුමිත්‍රයෝ ආයතනය
   3. මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය
   4. මිතුරු මිතුරෝ ආයතනය

4) රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධයෙන් වගකියන ආයතනය
   1. අධිකරණය
   2. විගණන දෙපාතර්මේන්තුව
   3. නීතිපති දෙපාතර්මේන්තුව
   4. ශ්‍රී ලංකා පොලිසිය ම

5) තම කටයුතු පහසු කර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදය
   1. ගවේෂණය
   2. තාක්ෂණය
   3. පර්යේෂණය
   4. නිරීක්ෂණය

• ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට √ හෝ X ලකුණ යොදන්න

6) තාක්ෂණයේ දියුණුවත් සමග මිනිස් අවශ්‍යතා ද සංකීර්ණ වී තිබේ. ( )

7) මානව හිමිකම් කොමිසම මගින් මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සිදුවේ ( )

8) පුද්ගලයෙකු සමාජයට හැඩ ගැසීමේ මූලික පුහුණුව පාසලෙන් ලබා දෙයි. ( )

9) ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම හමුදාවල ප්‍රධාන වගකීමයි ( )

10) සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ පුද්ගලයාටය ( )

• 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න.

11) නිදහස් පසෙනි නිදහස් ශ්‍රමය වැළැක්වීමට පියවර ගත්තේ ..................................ය

12) පවුලෙන් ලැබෙන සමාජ සුරක්ෂිතතාව සඳහා නිදසුනක් ලෙස.......................... ගත හැකියි

13) සාධාරණ නීතිගරුක සමාජයක් ගොඩනැගීම ..................................ආදශර් පාඨයයි

14) සොයාගැනීම් රැසක් ලෝකයට දායාද වූයේ ..............................ප්‍රතිඵලයක් ලෙසය

15) අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී යයි පැවසුවේය ..............................ය

( මර්සලින් ජයකොඩි පියතුමාය/ රස පරීක්ෂක දෙපාතර්මේන්තුවේ /තෝමස් අල්වා එඩිසන් / කාර්මික විප්ලවයේ /කුමාරතුංග මුනිදාස මහතාය /ඒබ්‍රහම් ලින්කන් ජනාධිපති )

- 16 සිට 20 දක්වා ප්‍රශ්න වල A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් සොයා ලියන්න.

| A | B |
|---|---|
| 16) පොලිසියේ කාර්යයකි | යුක්තිය පසිඳලීම |
| 17) බන්ධනාගාර දේපාර්තමේන්තුවේ කාර්යයකි | ආරක්ෂිත ලෙස වාහන ධාවනයට යොමු කරයි |
| 18) නාවික හමුදාවේ ප්‍රධාන කාර්යයකි | ළමා හිංසනය වැලැක්වීම |
| 19) අධිකරණයේ කාර්යයකි | දූපත් අතර ප්‍රවාහන පහසුකම් සැපයීම |
| 20) ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යයකි | නීතිගරුක හා මානව හිතවාදි යහපත් පුරවැසියන් සමාජගත කිරීම |

## II කොටස

- පළමු ප්‍රශ්නව අනිවාර් ය වේ. තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

1)

i. සමාජ සුරක්ෂිතතාව යන්න හඳුන්වන්න
ii. සමාජ සුරක්ෂිතතාවට පවුලෙන් ඉටුවන කාර්යන් දෙකක් ලියන්න
iii. නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න
iv. සමාජ ආයතන දෙකක් ලියන්න
v. ඉහළම අධිකරණ ආයතනය කුමක්ද ?
vi. තාක්ෂණික වෙනස් වීම නිසා ඇතිවී ඇති හිතකර බලපෑම් දෙකක් ලියන්න
vii. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක්ද ?
viii. අන්තර්ජාතික වශයෙන් බලපැවැත්වෙන නීති දෙකක් ලියන්න

(ල. 2x8=16)

2)

i. නීතිය යන්න හඳුන්වන්න ල.02
ii. නීතියේ ගුණාංග දෙකක් ලියන්න ල.04
iii. හිස්තැන් පුරවන්න ල.05

දේශීය නීතිය

1. .................................. 2. .................................. 3. ..................................

උදා 1. .................................. උදා. 1. ..................................

2. .................................. 2. ..................................

2024.06. 9 ශ්‍රේණිය පුරවැසි

3)

i. සමථ මණ්ඩලයට පත්වන සාමාජිකයින් කුමන ආකාරයේ ගති ලක්ෂණ ඇති අය විය යුතුද? ල.02

ii. ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමු කළ හැකි ආකාර කීයද ? ඒවා මොනවද ? ල.04

iii. සමථ මණ්ඩලය සම්බන්ධ පුද්ගල යුතුකම් තුනක් ලියා විස්තර කරන්න ල.05

4)

i. තිරසර සංවර්ධනය යන්න හඳුන්වන්න ල.02

ii. තිරසර සංවර්ධනය යන්න හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න ල.04

iii. තිරසර සංවර්ධනය හා යෝග්‍ය තාක්ෂණය භාවිත කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියා විස්තර කරන්න ල.05

5)

i. පොලිසියේ ආදර්ශ පාඨය ලියා දක්වන්න ල.02

ii. පහත ආයතන වල හදිසි දුරකථන අංක ලියා දක්වන්න
ශ්‍රී ලංකා පොලිසිය
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ල.04

iii. අධිකරණ පද්ධතිය ඉහළ සිට පහළට ලියා දක්වන්න ල.05

6)

i. තම නිවසේ වැඩ කටයුතු පහසු කර ගැනීමට යොදා ගන්නා උපකරණ දෙකක් ලියන්න ල.02

ii. තාක්ෂණය වෙනස්වීමේ අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න ල.04

iii. තාක්ෂණය වෙනස්වීම කෘෂිකාර්මික අංශයට බලපෑ ඇති ආකාරය විස්තර කරන්න ල.05

Learning Resource Centre
R
De Mazenod College
Kandana